SOEURS DE LA PROVIDENCE DE RUILLE SUR LOIR

Le Mans le 14 décembre 2016

අපගේ ආත්මීක පවුලේ සාමාජිකයන් වෙතයි

ආදර සොහොයුරියනී, මිතුරියනී,

ආගමන කාලය කෙමෙන් අවසාන වෙමින් පවතියි. යුරෝපා රටවල , සති ගානක් තිස්සේ වීථි සියල්ලම සැරසිලි වලින් ආලෝකමත් වී තිබේ. නත්තලට සූම් වීමට, තෑගි බෝග ගැනීමට, මංගල්‍යය භෝජනය පිළියෙල කිරීම කාළය එළඹී ඇති බව මතක් කරයි. නත්තල් උත්සවය සඳහා සූම් වීමට ඇත්තේ මෙම අරමුණ පමණක්ද? පිළිතුර එසේ නොවෙයි. ක්‍රිස්තියානින් වන අපට, ආගමන කාළය, සිත් හැරීමේ සහා ජීවිතය අලුත් කර ගැනීමේ කාළයයි. අපට ආරාධනා කරන්නේ වානිජ්‍යම රැල්ලට පිටුපා නත්තල සැමරීමටයි.

යෙසායා,ස්නාවක ජුවාම්, සහ මරිය තුමී, මෙම විශේෂ පුද්ගලයින් තිදෙනා නත්තල වෙතට අප කැටුව ගමන් කරයි.
ඔවුන් ගැළවුම් කරුවාණන් ගේ පැමිණීමේ ශුභ ආරාංචිය ප්‍රකාශ කරන අතර, අසාධාරණය තදින්ම හෙළාදකයි.
අපගේ ජීවිත පරිවර්ථනයට මඟ පෙන්වයි, ලෝකයට ඇතුල් වන ආලෝකය වෙතට මඟ පාදයි : ක්‍රිස්තුස්.

**වේදනාවෙන් පසු වූවන්ට අඳුර තවත් බල නොපායී යෙසායා 9, 1**

ආගමන කාළයේ වත් පිළිවෙත් දවසින් දවස අපට ජීවිත වෙනසකට ඇරයුම් කරයි.
කාර්ඩිනල් ඩැනියෙල් ඔහුගේ නත්තල් පණිවුඩයේ
මෙසේ සඳහන් කරයි: ඔබගේ ඇතුලාන්තය කුටිය ස්වාමින්වහන්සේට සූම් කරන්න, උන්වහන්සේ ගවහලක් සෙවීමට අවශ්‍යය වන්නේ නැත.

අද ලොව පුරා මිනිසුන් දහස් ගණන් උන් හිටි තැන් අහිමි වී තම රටවල් වලින් නෙරපා දමා අසරණව වීථි වල රෑ දවාල් දිවි ගෙවති. ක්‍රිස්තියානී සහ පැවිදි අපට නත්තල අපත් දෙවියන් අතර තිබෙන සබඳියාවත්, අපගේ පවුල් සහ මිතුරන් සමඟ ගත කරණ ප්‍රීති දයක අවස්ථාවක් පමණක්ම නොව. නත්තල අපට ඇරයුම් කරන්නේ සාමයේ දොරටුවක් වීමටත්, සාධාරණත්වය ගොඩනගන්නෙක් හා දුගියාගේ ආරක්ෂකයා

වීමටත්ය! දෙවියන්වහන්සේ මෙලොවට  වැඩීමට තෝරා ගත්තේ දුබල දරුවකු ලෙසයි.

ප්‍රන්සුවා පාප් තුමන්ගේ දෙසැම්බර් අදහස මගේ සිතට කාවැදුනි.

**පැහැර ගෙන ගොස් වද දී මරණ  සන්නධ ගැටුම්**
**සහ ඔවුන් ගේ ළමා කාළය සොරකම් කර ළමා සොල්දවන් බවට පත් කිරීම ස්වාමින් වහන්සේ දකිති.**

දේව දරුවා ඔහුගේ මුළු ජීවිත කාළයටම දුගී, දුප්පත් , පවු කරුවන් සමඟයි.
විවිධ දිවැසි වරුන් පැවසූ ලෙස අප කැඳවා ඇත්තේ මුර කරුවන් හා මුර කාරියන් වීමට බවත් අපගෙ සිත්  වල මුරකරුවන් වුවහොත් , සිත් දැඩි කර නොගෙන අපගේ සොහොයුරු සොහොයුරියන් ගේ හුදකලාවට, දිළිඳු කමට
භිය සැකයෙන් තොරව  අවධානම් තත්වයනට කිසිඳු භියකින් තොරව මුහුණ දිය හැකි බව තව දුරටත්  මෙම පණිවුඩයේ සඳහන් වේ.

ජුද ජනතාව බලවත් ධනවත්, මෙසී රජ කෙනෙක් බලාපොරොත්තු වූහ. එනමුත් එතුමන් වැඩියේ ගව ලෙනක වැතිර සිටින කුඩා ළදරුවෙක් ලෙසිනි. ලොව පුරා උපත ලබන දරුවන්ට නොවෙනස්, වැඩිහිටියන් ගේ රැකවරණයට නතුව දුබල බෙල හීන ආරක්ෂාවක් නැති කෙනෙක් ලෙසින් උපත ලැබීය. ස්වාමින්වහන්සේ මෙලොවට සහ අපගේ ජීවිත වළට ඇතුල් වීමෙන් සියල්ල වෙනස් වුනි. ප්‍රබල දේ දුබල විය, දුබල දේ ප්‍රබල විය.

නත්තල් ජන වන්දනාවේ අපි මෙසේ ගායනා කරුමු: ඕ විෂ්මජනක ආදේශය!' මිනිසාගේ මැවුම් කරුවාණන් , කන්‍යාවක ගෙන් මිනිසත් බව ලැබීය. ක්‍රිස්තුස්තුමන් ගේ දේවයට අප පංගු කාරයන් වීමූ, එතුමන් අපගේ මිනිස් බව ගැනීමට තරම් බැහැපත් විය

**අපට දරුවෙක් ඉපදුනි, අපට පුතකු දෙනු ලැබීය. .........** මුළු ලොව පුරා ප්‍රකාශ විය. මෙම දරුවා අප එකි නෙකා අතර සුහඳ තාවය ඇති කරයි. මෙම පණිවිඩය අපගේ සිත් ප්‍රීතියෙන් සහ බලාපොරොත්තු වෙන් පුරවයි.!
ඔව්! නත්තල් පණිවිඩය , නොකඩවා අප අවට සාමුහික)ය ගොඩ නගයි.

ස්වභාවික විප්පත්ති වළදී, අසරණ වුවන්ට, නොදන්නා රට වලින් පැමිණෙණ සංක්‍රමණික පවුල් වලට උදව් කිරීම,පොදු හවුල් අතර සහයෝගීතාවය
නත්තල් පණිවිඩය අප අතර ජීවමාන බවට සලකුණකි.

පළමුව දේව බිළිද බැහැදැකීමට පැමිණියේ ප්‍රභූවරුන්වත්, ප්‍රසිද්ධියට පත් පුද්ගලයන් නොව,  දුප්පත්,  එඬේරුන්ය.
එඬේරුන් සලකන ලද්දේ කිසි වැදගැන්මක් නැති, විශ්වාස කළ නොහැකි පහත් ජන කොටසක් ලෙසිනී.

**අනාගතයේදී මෙම දරුවා මිනිස් සංහතියේම එඬේරාණන්ය.**

මේ මාංශගතවීමේ මහා අභිරහස , මෙනෙහි කිරීමට, යාඥද , කිරීමට කාළය ගනිමු:

ජේසු ක්‍රිස්තු, මාංශ ගතවූ වචනය දේව වචනය මිනිස් වචනය විය.
මාංශගතවීම 'මහා අභිරහසේ අභිරහසයි' එය අපට මනුෂ්‍ය සංහතිය වෙත දෙවිඳුන් ගේ දේව සැලස්ම හා ගැඹුරු සමීපතාව හෙළිදරව් කරයි. (ස්ප්‍රිචුවල්ටි පොතේ:පිටු. 42)

ස්වාමින් වහන්සේ අප අතරයි, එම්මානුවෙල්, ස්වාමින්වහන්සේ අප සමඟයි, ස්වාමින්වහන්සේ අපෙන් කෙනෙකි.

ප්‍රශංසාවේ ගීතය ගායනා කිරීමට, මුළු විශ්වය සමඟ අප සිත් එක්සිත් කර ගනිමු.

**ස්වාමින්වහන්සේට මහිමයත්, ප්‍රේම කරන්නන්ට මිහිමත සාමය!!!**

නත්තල අපගේ නිකායේ මංගල්‍යයයි. අපගේ හදවත් ප්‍රීතියෙන් පූරවයි, අපට මුණගැස් වන සෑම කෙනෙක් වෙතම සැලකිළිමත් වෙමු. (ව්‍යවස්ථාව නො. 7)

ශුභ නත්තලක්

සි. මාර්ටින් මෙවසීන්

සුපීරියර් ජෙනරල්